## කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2014

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1985 අංක 02 දරන පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 20 වන වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමග සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1. 4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව ත්‍යාග හා ආධාර යටතේ ලද වත්කම් රු.257,380 ක් වෙනුවෙන් වූ ක්‍රමක්ෂය ත්‍යාග හා ආධාර අරමුදලටද ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් රු.13,479,529 කට අදාළ ක්‍රමක්ෂය ප්‍රත්‍යාගණන සංචිතයට ද එරෙහිව ලියාහැරීම වෙනුවට සියලු ක්‍රමක්ෂය ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට ලියාහැර තිබුණි. එමෙන්ම ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල ක්‍රමක්ෂය ස්කන්ධයට ගැළපීම වෙනුවට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගළපා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පෙර වර්ෂ වලට අදාල රු.703,356 ක් වූ ආදායම් සහ රු.292,530 ක් වූ වරිපනම් බදු අතීතානුයෝගීව ගැලපීම් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම් ගතකර තිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

වසර ගණනාවකට පෙර අවසන් වූ සරෙක් ව්‍යාපෘතියට අයත් වත්කම් රු.5,561,848 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබූ නමුත් මෙම වත්කම් වල පැවැත්ම කිසිදු වත්කම් සමීක්ෂණයකින් අනාවරණය වී නොතිබුණි. ගිණුම් වල ඇතුලත් ඉහත සඳහන් වත්කම් භෞතිකව සත්‍යාපනය කර නොතිබූ බැවින් එහි නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයෙහි ලැබිය යුතු ගිණුමෙහි දක්වා තිබූ රු.1,163,324 ක ශේෂය තුල රු.79,431 ක ශේෂයක් සරෙක් ව්‍යාපෘතියෙන් (Swedish Agency for Research Corporate with Developing countries ) ලැබිය යුතු ලෙස වර්ෂ ගණනාවක සිට පැවැතුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් යටතේ තොග ගැලපුම් ගිණුම ලෙස රු.41,505 ක ශේෂයක් 2007 වර්ෂයේ සිට නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඇ) 1995 වර්ෂයේ අවසන්ව තිබුණු "සරෙක් ව්‍යාපෘතියේ" වත්කම් හා බැරකම් පවරාගෙන ඇති අතර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුල දැක්වෙන රු.5,164,816 ක් වූ ජංගම වත්කම් හඳුනා ගෙන ගිණුම්වල ගැලපීමට 2014 දෙසැම්බර් 31 දක්වාද කටයුතු කර නොතිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ යටතේ දක්වා තිබූ රු.1,997,856 ක ශේෂය තුල වර්ෂ 03 ක් ඉක්මවන උපදේශක සේවා ගාස්තු රු.215,341 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශන වල වෙනත් වගකීම් යටතේ දක්වා තිබූ රු.1,890,508 ක ශේෂය තුල විගණිත දිනය වූ 2015 ජූනි 30 වන විට අවසන් වී තිබුණු ව්‍යාපෘති ශේෂ හා බාහිර පාර්ශවයන්ගෙන් ලද ප්‍රදානයන් රු.693,966 ක් වසර ගණනාවක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයෙහි XX වන පරිච්ඡේදයේ 3(1)වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා නිවාඩු තහවුරු කර ගැනීමකින් තොරව වැටුප් හා දීමනා වශයෙන් රු.19,792,575 ක් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.6,412,197 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,823,191 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,589,006 කින් පිරිහී තිබුණි. පෞද්ගලික පඩිනඩි රු.6,587,971 කින් වැඩි වීම ඒ සඳහා විශේෂයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බැඳුම්කර කඩකිරීමෙන් අයකර ගන්නා ලද රු.229,402 ක් 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ප්‍රශස්ත ආයෝජනයක යෙදවීමකින් තොරව දීර්ඝ කාලයක් තුල බැංකු ජංගම ගිණුමක පැවතීමෙන් මූල්‍ය කලමනාකරණයේ දූර්වලතා පිළිබිඹු විය.

(ආ) රාජකාරීමය කටයුත්තක් සඳහා යාපනය විශ්වවිද්‍යාලයට යාම වෙනුවෙන් මිල කැඳවීම් නොකර අධ්‍යක්ෂවරයාගේ නමින් වාහනයක් කුලියට ගෙන තිබුණු අතර කි.මී. 1ට රු.40 බැගින් කිලෝමීටර 1195 ක් සඳහා රු.47,800 ක මුදලක් ගෙවා තිබුණි. යාපනය විශ්වවිද්‍යාලය මඟින් මෙම වියදම ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ආයතනය විසින් ගෙවීම් කර තිබුණද මෙම වියදම 2015 ජූලි 08 විගණිත දිනය වනවිටත් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.2 සේවක මණ්ඩල**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතනයේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 04 ක් පැවති නමුත් එය පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.**

**(ආ) පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සඳහා අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව 2014 වර්ෂයේදී කාර්ය පැවරුම් පදනම මත පර්යේෂණ සහයක (Research associate) නිලධාරීන් දෙදෙනෙක් හා තාවකාලික පර්යේෂණ ඉගැන්වීම් සහකාර නිලධාරීන් තිදෙනෙකු කලමනාකරණ මණ්ඩල අනුමැතියෙන් පමණක් බඳවා ගෙන ඔවුන් වෙනුවෙන් වැටුප් ප්‍රතිපාදනය කර නොතිබියදී රු. 1,650,000 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.**

**4.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

**කොන්ත්‍රාත් වටිනාකම රු.4,464,841 ක් වු කෞතුකාගාර ගොඩනැගිල්ල 2011 දෙසැම්බර් 20 දින ආරම්භ කර 2012 මාර්තු 20 දින නිමකළ යුතු වුවත් 2013 පෙබරවාරි 01 දින නිම කර තිබු අතර අනාවරණය වු අඩුපාඩු නැවත සකස් කර ප්‍රමාද ගාස්තු හා අනිකුත් අඩු කිරීම් සිදුකර අවසන් බිල්පත ගෙවා නිරවුල් කිරීමට විගණිත දිනය වු 2015 ජුනි 30 දින තෙක් කටයුතු කර නොතිබුණි.**

**5. ගිණුම්කටයුතුභාවය හා යහ පාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ) ආයතනයේ 2014 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුළ ඉටුකළ යුතු ප්‍රධාන ක්‍රියාකාරකම් 16 ක් දක්වා තිබු නමුත් උසස් ගුණත්වයෙන් යුතු වු පර්යේෂණ පත්‍රිකා දේශීය හා ජාත්‍යන්තර සඟරා වල පළ කිරීම, අධ්‍යයන වැඩසටහන් සඳහා විදේශ සිසුන් බඳවා ගැනීම යන ක්‍රියාකාරකම් ඉටුකර නොතිබුණි.**

**(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අදාල කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්ය සාධනය ඇගැයීම කර ප්‍රගති වාර්තා සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.**

**5.2 අයවැය ලේඛනමය පාලනය**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ) සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් සැසඳීමේදී සියයට 33 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් පැවති බැවින් අයවැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.**

**(ආ) වර්ෂ ගණනාවකට පෙර අවසන් වී තිබු Annual Bibliography of Indian ArcheaoLogy (ABIA) ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේ අනුමත අයවැය ලේඛනය මඟින් වෙනත් වියදම් ශිර්ෂය යටතේ ABIA ව්‍යාපෘති වියදම නිශ්චිතව දැක්වීමකින් තොරව එකතුව රු.1,700,000 ක් වෙන් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය යටතේ අන්තර්ජාලය මඟින් සොයාගත් පුරාවිද්‍යා පර්යේෂණ තොරතුරු ඇතුලත් කරන ලද පොත් (Annotation) 147 ක් වු අතර ඒ සඳහා මුළු වියදම රු.658,926 ක් දරා තිබු බවණි.**

**6.** **පද්ධති හා පාලනයන්**

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින් වර යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.**

**(අ)** **ස්ථාවර වත්කම් පාලනය**
**(ආ)** **පුස්තකාල පාලනය**
**(ඇ)** **කොන්ත්‍රාත් පරිපාලනය**